# ජාතික අධ්‍යාපණ ප්‍රතිව්‍යුහකරණය

**හැඳින්වීම:**

දැනට පවත්නා ජාතික අධ්‍යාපණ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ජාතික සමෘධිය පිණිස සෘජු දායකත්වයක් දරන්නේද යන්න ගැඹුරින් සලකාබැලිය යුතු කරුණකි.

ලොව අන්කිසිදු රටකට ප්‍රථමයෙන් නිදහස් අධ්‍යාපණයේ භාග්‍යයලද අප එයින් දශක හතකට පසුවවත් අඩුතරමින් කළාපීය රටවල් අතරෙහි හෝ කැපීපෙනෙනා ආර්ථික වර්ධනයක් ලබාගැනීමට අපොහොසත්වූයේ මන්ද?

1. නිදහස් අධ්‍යාපණයේ වරදින්ද?
2. විෂයමාලා දිශාණතියෙහි වරදක්ද?
3. පසුවිපරම් පාදක ප්‍රතිසංස්කරණයන් සිදුනොවූ බැවින්ද?

**පත්‍රිකාවෙහි අරමුණ:**

1. අධ්‍යාපණ ශේත්‍රයෙහි පවත්නා ඌනතා විශ්ලේශණය
2. ජාතික සමෘධිය ඉලක්කගත ශ්‍රමබලකායක අවශ්‍යතාවය
3. සීග්‍ර ආර්ථික වර්ධනයක් ඉලක්කගත ජාතික අධ්‍යාපණ ප්‍රතිසංස්කරණ සැලසුම
4. දේශීය උරුමයේ දැනුම්සම්භාරය හා ගෝලීය නවතාක්ෂණ ප්‍රවණතාවයන් අන්තර්ග්‍රහණයවන වනපරිදි විශ්වවිද්‍යාල අධ්‍යාපණය ජාත්‍යන්තර මට්ටමට උසස් කිරීම  හා නිදහස් අධ්‍යාපණ මූලධර්මයන් තුල ජාතික අධ්‍යාපණය ආදායම් උපයන මට්ටමට නගාසිටුවීම.

## **01- ගැටලු විශ්ලේශණය:**

නිදහස් අධ්‍යාපණය වනාහි රැකගතතුතු මහගු සමාජවාදී දායාදයක් වුවද එහි ඉලක්කගත ප්‍රථිඵලය රටට අහිමිවූයේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේ තිබූ අඩුලුහුඩුකම් හේතුකොටගෙනබව පැහැදිලිව පෙනෙන්නට ඇත;

1. එදාමෙදාතුර යම්යම් ප්‍රතිසංස්කරණ සිදුකරනු ලැබුවද සමස්ථයක්වශයෙන් අපගේ විශයමාලාවන්හි  දිශාණතිය ජාතික සංවර්ධණයේ හා නිශ්පාධනයේ අවශ්‍යතාවය සමග සෘජුව යොමුගතවී නැත.
2. තවද නිදහස් අධ්‍යාපණයේ අස්වැන්න අවශෝෂණය කරගැන්මට තරම් ප්‍රමාණාත්මක කර්මාන්ත හා රැකියා ප්‍රස්ථාවන් බිහිකිරීමට රටෙහි දුර්වල හා කෙටිකාලීන සංවර්ධණ ක්‍රමෝපායන් සමත්වීනැත.
3. විදේශ විශ්වවිද්‍යාල ඒකාබද්ධ අධ්‍යයන ව්‍යාපෘථි මගින් සහ විදේශ ශිෂ්‍යත්ව ශිෂ්‍යසමායෝජනය මගින් ගෝලීය නවදැණුම් ප්‍රවාහය හා යාවත්කාලීන නොවීම.

4. නොහොබිනා පක්ෂදේශපාළන ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාල තුලට ව්‍යාප්තවීමෙන් අත්‍යවශ්‍ය සාධකයක්වූ අධ්‍යාපන විණය පරිහාණියට පත්වීම හා අධ්‍යයන කාළය දීර්ඝලෙස අපතේයාම.
5. විශය ශේත්‍රයන් අරබයා උස්මිටිකම් පිලිබඳ එල්බගත් නොමනා සමාජ මතිමතාන්තර හේතුකොට සමහර විශයධාරාවන් හදාරණ සිසුන් අසහනයට හා උදාසීනබවට පත්වීම.
6. පසුඅධ්‍යාපණ සමීක්ෂණ හා නිසි වෘතීය සමායෝජන කළමණාකරණයක් නොමැතිකමින් ඇතිවන විරැකියාව හේතුකොට සිද්ධවන බුද්ධිගලනයේ විදේශාඨනය. (මෙම අවදියේදී රටින් බැහැරවන සිසුන් නැවත නොපැමිණෙන බව සනාථවීඇත. ඉඩකඩමිද විකුණා විදෙස්ගතවීමේදී රටෙහි ස්ථාවරධනය අහිමිවීමද එතෙක් නිදහස්අධ්‍යාපණ ධාරාවෙන් ආයෝජණයකළ ධනය හා අපේක්ෂිත ප්‍රතිඵලය රටට අහිමිවීමද සිද්ධවෙයි)

7. අධ්‍යාපණය හුදෙක් ආකර්ෂණීය ආර්ථික කර්මාන්තයක් කොටගත් දියුණු රටවල් ඉතා සූක්ෂමලෙස තමවිදේශ ප්‍රතිපත්ති සැළසුම්කරණයෙහි යෙදෙමින් අපගේ නිදහස් අධ්‍යාපණයේ ප්‍රථිලාබය උපරිමයෙන්ම නෙලාගන්නාබව මොනවට පැහැදිලි කරුණකි.
8. තවද බුද්ධිගලනයේ විදේශාඨනයට මහත්සේ රුකුල්දෙන පරගැති යටත්විජිත චින්තනය සිසුන්තුල පමණක්නොව සමස්ථ ශ්‍රී ලාංකීය  සමාජයතුලම ස්ථාපිතව පැවතීමට හේතුව කුමක්ද?  නිදහස් අධ්‍යාපණ වරම දිනාගත් සමයේදීම සිද්ධවියයුතුව තිබූ අධ්‍යාපණ විෂයමාලා සංශෝධණය අදදක්වාත් සිද්ධවනොතිබීමේ හේතුවෙන් ජනතාවතුල දේශමාමක චින්තනය වර්ධනය නොවීමයි.

   1)-ලොව ඉපැරණිම මාණවසම්භවයට හිමිකම් සපුරාසිටින දේශයේ සැබෑ ඉතිහාසය අදටත් අධ්‍යාපණ විශයමාලාවට ඇතුලත්කොට තිබේද? නැත.

   2)-සිග්මන් ප්‍රොයිඩ් විසින් දක්වාඇති සිද්ධාන්තයට අනුව පස්වැනිවියට පාතබන දරුවා සියදිවියේ මාණව ප්‍රතිරූපය හා පෞර්ශවය ගොඩනගා හමාරය. ඉන්පසුවට අධ්‍යාපණය මගින් ඉටුකළහැක්කේ පුරුෂාර්ථයේ වස්තුබීජය දැණුමින් පෝෂණයකිරීම හා දිශාණතිය සකස්කිරීම පමණකි.  පස්වැනිවිය දක්වා දරුවා ඉතාකඩිනමින් උකහාගනුයේ සිය මවුබසෙහි ගැබ්වඇති ආවේණිය කුසළතා සම්භාරයයි (hereditary aptitudes). එම අවදියේදී භාෂාවන් කිහිපයක් පටලවාලීමෙන් එකිනෙකට ඉඳුරාම වෙනස් ප්‍රභව සංස්කෘතීන් කිහිපයක් අතර අතරමංවන දරුවාගේ නවනිර්මාණ ශක්තිය(creativity) අඩාලවන බැවින් ප්‍රවීණයන් බිහිවීමද වලකාලයි. අධ්‍යාපණ ප්‍රතිසංස්කරණ සැළසුම්කරණයේදී

මෙය වැදගත් සාධකයක් වනුයේ මන්ද? නවනිර්මාණකරණයෙන් තොරව ජාතියක් ලොවෙහි නොනගිනා බැවින්ය.

## 2- ජාතික නිපුණ ශ්‍රමබලකාය ගොඩනැගීම (National Skill Workforce(NSWF):

ජාතික හා ජාත්‍යන්තර ශ්‍රමබලකා අවශ්‍යතා අධ්‍යයනයේදී යාවත්කාලීන සියලුම ශේත්‍රයන් ආවරණය වන පරිදි ශ්‍රමිකයන් ප්‍රධාන පැකේජ පහකට ගොනුකොට අධ්‍යාපණයේ සාමාණ්‍යපෙළ අවදියේ පටන්ම 'පන් පසිඳුවන්'(Famous Five) සංකල්පයට අනුකූලව නිවැරදි වෘතීය දිශාණතියට අනුගතකළ යුතුය.

'පන්පසිඳුවන්'(Famous Five) වෘතීය කුසළතා වර්ගීකරණයඃ

1. **ඉදිකිරීම් සුහුරුවන්** (Constructive Expert)
2. **නිෂ්පාධන සුහුරුවන්** (Productive Expert)
3. **සෞඛ්‍යාරක්ශණ සුහුරුවන්** (Health Care Expert)
4. **සමාජසංස්කෘති ආරක්ශණ සුහුරුවන්** (Sociocultural Care Expert)
5. **ආර්ථිකාරක්ශණ සුහුරුවන්** (Economic Care Expert)

## 03- ජාතික අධ්‍යාපණ ප්‍රතිසංස්කරණ යෝජනා:

### 3.1 විෂයානුබද්ධ ශේත්‍ර වර්ගීකරණය:

සමාන සාමාජීය පිළිගැනීමකින්යුතු ප්‍රධාන ශේත්‍ර පහක් තුලට සියලුම විෂයයන් අන්තර්ග්‍රහණය කෙරෙන අතර උසස්පෙළ ප්‍රවේශයේදී විෂයාණුබද්ධ හා ප්‍රායෝගික කුසළතා ප්‍රදර්ශණය පාදකව පාඨමාලාවන් සඳහා සිසුන් තෝරාගැනෙයි.

තවද සාමාන්‍යපෙළ මට්ටමේ පටන්ම 'පන්පසිඳු වෘතීය දිශාණතිය' සිසුවාගේ කැමැත්ත අනුවම තීරණයවන පරිදි අතිරේක විෂයන් තෝරාගැනීමේදී සවයංවරණයකට ඉඩ ප්‍රස්ථාව සැලසෙයි.

# පන්පසිඳුවන් සංකල්පය

සමාන වෘතීය පිළිගැනීමෙන් යුතු ශේත්‍ර පහක සුහුරුවන්ගෙන් සැදුම්ලත් ජාතික ශ්‍රම බලකායක් ගොඩනැගීම තුලින් කඩිනම් ජාතික සංවර්ධනයක් ඉලක්කකෙරෙයි




Famous five field specializations to undertake Global Challenges

**3.2- ජාත්‍යන්තර ප්‍රමිතියේ විශ්ව විද්‍යාල අධ්‍යාපණය:**

උසස්පෙළ විභාගයෙන් කඩඉම් ළකුණුලබා සමත්වන දරුවනට විශ්ව විද්‍යාල ප්‍රතිපාධන කොමිසම මගින් 'නිදහස් අධ්‍යාපණ ශිෂ්‍යත්ව' ප්‍රධාණය කරනුලබයි

ශිෂ්‍යත්වයෙහි මූල්‍යමය වටිනාකමද සඳහන්වන අතර උපාධි ප්‍රධානයෙන් පසුව පස්වසරක අනිවාර්යය ජාතිකසේවය නිමවීමෙන් හෝ පොලියද සමග ආයෝජිත මුදල ගෙවාදැමීමෙන් පමණක් ප්‍රතිලාභියා විදේශාධනය සඳහා නිදහස් කරනුලබයි

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල අධ්‍යාපණය ගෝලීයකරණය කිරීමේ ආකර්ෂණීය සැලැස්මක් ලෙස සමස්ථ ප්‍රස්තාවෙන් 10% ප්‍රමාණයක් ඌනසංවර්ධිත රටවල ළමුන් සඳහා 75% මූල්‍යසහන පදනම මත ශිෂ්‍යත්ව පිරිනැමෙයි

අතීතයේ  මෙරට පැවති තක්සලාව හා මහවෙහෙර විශ්වවිද්‍යාල පීඨයන් මෙන් ජාත්‍යන්තර කීර්තිය දිනාගැනීම පළමු ඉලක්කයවන අතර එනයින් ශ්‍රී ලංකා උසස් අධ්‍යාපණය ආදායම් උපයන සේවාකර්මාන්තයක් බවට පත්කිරීමද අපේක්ෂාකෙරෙයි

**3.3- වෘතීය විශ්වවිද්‍යාල අධ්‍යාපණය:**

උසස්පෙළ ඉහළ සාමාර්ථය නොලද දරුවන් වෘතීය අධ්‍යාපණ උපාධි ශිෂ්‍යත්ව පාඨමාලාව සඳහා තෝරාගැනෙයි දෙවසරක පූර්ණවිශයානුබද්ධ පාඨමාලාව හා වසරක ක්ෂේත්‍ර පුහුණුවෙන් උසස් ජාතික ඩිප්ලෝමා (**HND qualification** of NVQ level-06) ලාභීන්වනුලබයි

අනතුරුව ඔවුන් වෘත්ථීය උපාධි පාඨමාලාවට බඳවාගැනෙන අතර රැකියාස්ථානයන්හි වසරක් සඳහා අධ්‍යයණ සහණ දින හතරහමාරක වැඩසතියක හිමිකම්ද ලබයි

උපාධි ප්‍රධාණයෙන් පසුව වසර හතරක අනිවාර්ය ජාතිකසේවය හෝ පොළියද සමග ශිෂ්‍යත්ව ගාස්තුව ගෙවාදැමීමෙන් අනතුරුව ප්‍රතිලාභියා විදේශාඨනය සඳහා නිදහස් කරනුලබයි

තමන් කැමති පාඨමාලාව හැදෑරීමට තරම් ප්‍රමාණවත් උසස්පෙළ සාමාර්ථයක් නොලද දරුවන් සඳහා සහනයක්ලෙස නැවත අවශ්‍ය විෂයන් සඳහා පමණක් පෙනීසිට ලකුණු 65% වැඩි සාමාර්ථයන් ලබාගැනීමට ප්‍රස්තාව සැලසෙයි නොඑසේනම් අත්පිට මුදල් ගෙවීමෙන් වසරක උපකාරක පාඨමාලාව සඳහා( **Catch up Program**) පීඨයට බඳවා ගැනෙයි.

ජාතික වෘතීය හා අන්තර්ජාතික වෘතීය සුදුසුකම් සලකා කාලීන විෂයමාලා සංවර්ධනය එම වෘතීය විශ්වවිද්‍යාලවලට පැවරෙන අතර ජාතික උපදේෂණ කොමිසමෙහි (National Advisory Commission) අනුමැතියට යටත්වෙයි

**3.4- වෘතීය තාක්ෂණ විද්‍යාල අධ්‍යාපණය:**

සාමාන්‍යපෙළ සමත් දරුවන් බඳවාගනුලබන අතර එක්අවුරුදු පූර්ණවිශයානුබද්ධ පාඨමාලාව හා ජාතික ආධුනිකත්ව මණ්ඩලය(NAB) මගින් නියාමණය කෙරෙන එක්අවුරුදු වෘතීය ක්ෂේත්‍ර පුහුණුවෙන් අනතුරුව වෘතීය කුසළතාවන් අගැයීමට ලක්කර (Skill Assesment) ජාතික වෘතීය සුදුසුකම් -04 මට්ටමේ **(NVQ level-04)** සහතිකය ප්‍රධානය කෙරෙයි

තවද වසරක වෘතීය සේවයෙන් අනතුරුව වෘතීය කුසළතා අගැයීමකට ලක්කෙරෙන අතර එයින් සමත්වන්නන් ජාතික වෘතීය සුදුසුකම් -05 මට්ටමේ **(NVQ level-05)** ඩිප්ලෝමාධාරීන් ලෙස වෘතීය විශ්වවිද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලබයි

## 04- උසස්පෙළ අධ්‍යාපනය (AL)

### 4.1-නිදහස් අධ්‍යාපන ශිෂ්‍යත්ව :

යායුතු වෘතීය මාවත උසස්පෙළ අවදියේදීම ශිෂ්‍යයාට තෝරාගැනීමට ඉඩහැරීමෙන් 'පන්පසිඳු' දහරාවතුල **වෘතීය ශේත්‍ර ප්‍රවීණයන්** බිහිකිරීම ඉලක්ක කෙරෙන අතර ශිෂ්‍යයන් තුල නිෂ්චිත ගමනාන්තයක්කරා සවයංප්‍රේරණයක් ඇතිකරවයි

තම අධ්‍යාපණය පිණිස රජයවිසින් කරනුලබන විශාල ආයෝජණය පිළිබඳ හැගීමක් ශිෂ්‍යයාතුල ඇතිවනපරිදි ප්‍රධානයකරනු ලබන **නිදහස් අධ්‍යාපණ ශිෂ්‍යත්වයේ** මූල්‍යමය තක්සේරුවද සඳහන්කෙරෙයි

ජාතික හා අන්තර්ජාතික කාලීන ශ්‍රමබලකාය ඉලක්කගත පන්පසිඳු සංකල්පය කේන්ද්‍රකොට ශිෂ්‍යයාතුල සවයංවෘතීය අභිප්‍රේරණය හා ආකර්ෂණය ඇතිවනඅයුරු **විෂයමාලා සංවර්ධනය** ජාතික අධ්‍යාපණ ආයතනය ප්‍රමුඛ විශ්වවිද්‍යාල ආචාර්ය කමිටුවකින් කෙටුම්පත් කෙරෙන අතර ජාතික උපදේෂණ කොමිසමෙහි (NAC) අණුමැතිය සඳහා ඉදිරිපත්කළයුතුය.

විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඇවසි ප්‍රවිශ්ඨ සාමාර්ථය නොලබන සිසුන් සඳහා තමවියදමින් එක්වසරක **පුණරීක්ෂණ විභාගයකට** ඉදිරිපත්වීමේ ප්‍රස්ථාව හිමිවනඅතර එහිදී විශයන් හතරින් 50%ටඅඩු විෂයයන් දෙකක් සඳහා ඉදිරිපත්ව **75%** කටවැඩි සාමාර්ථයක් ලබාගතයුතුවෙයි

## 05- සාමාන්‍යපෙළ අධ්‍යාපනය (grades 9,10,11)

<u>අරමුණු</u>:

1. දරුවාතුල සමාජ සංස්කෘතික ශික්ෂණය ස්ථාපණය කිරීම
2. 'පන්පසිඳු' වෘතීය පදනම ඉලක්කගත විශයානුබද්ධ මූලිකදැණුම ලබාදීම.

<u>මාධ්‍යය</u>:

1. සිංහළ + ඉංග්‍රීසි -වරණය
2. දෙමළ + ඉංග්‍රීසි -වරණය

<u>විශයන්</u>: (දහයක් තෝරාගතහැකිය)

1. සංස්කෘථික උරුමය (පොදු)
2. ආගමික දර්ශණවාදය (පොදු)
3. සංඛ්‍යානය (පොදු)

4. පරිසර විද්‍යාව (පොදු)
5. භාෂා විද්‍යාව -(සිංහල, දෙමළ, ඉංග්‍රීසි)- වරණය
6. භෞතික විද්‍යාව –(වරණය)
7. රසායණ විද්‍යාව -(වරණය )
8. ඉංජිනේරු ගණිතය -(වරණය)
9. ජීව විද්‍යාව –( වරණය)
10. කෘෂිකර්මය –( වරණය)
11. සමාජ විද්‍යාව-( වරණය)
12. ව්‍යාපාර අධ්‍යයනය-( වරණය )
13. ආර්ථික විද්‍යාව-( වරණය )
14. ඝනකාධිකරනය –( වරණය )
15. දේශපාලන විද්‍යාව- (වරණය )
16. ඉතිහාසය- (වරණය )
17. ආගම (බුදු දහම, හින්දු දහම, කිතුණු දහම, ඉස්ලාම් දහම) -(වරණය )
18. රූපණ කලාව, සංගීත කලාව, සංස්කෘතික නර්තණය-(අතිරේක කුසළතා)
19. ක්‍රීඩා කෞශල්‍යය-(අතිරේක කුසළතා)
20. සාමාජීය හා පාරිසරික ක්‍රියාකාරකම් -(අතිරේක කුසළතා)

<u>'පන්පසිඳු' ධාරාවන්ට අනන්‍යවූ විශය කුලකයන්:</u>

1. **ඉදිකිරීම් විෂය ධාරාව**:- [1,2,3,4] පොදු +[ 6,7,8] විශේෂ + [02] කැමති+ [01] කුසළතා
2. **නිෂ්පාදන විෂය ධාරාව**:- [1,2,3,4] පොදු+ [6,7, (8 or 10)] විශේෂ +[02]කැමති+[01] කුසළතා
3. **ශාරීරික හා පාරිසරික සෞඛ්‍ය විෂය ධාරාව**:- [1,2,3,4] පොදු+ [6,7,9] විශේෂ + [02] කැමත+ [01] කුසළතා
4. **සමාජ සංස්කෘතික ආරක්ෂණ විෂය ධාරාව** :- [1,2,3,4] පොදු + [ 11,15, (13 or 16 or 17] විශේෂ +[02] කැමති +[01] කුසළතා
5. **සංඛ්‍යාමණ හා ආර්ථික විශ්ලේෂණ විෂය ධාරාව**:- [1,2,3,4] පොදු + [12, 13,14 ] විශේෂ +[02] කැමති +[01] කුසළතා

විශේෂ සටහනඃ

සංස්කෘතික උරුමය, ආගමික දර්ශණවාද, දේශපාලන විද්‍යාව, ඉතිහාසය, ආගම යන විෂය නිර්දේශයන් කෙටුම්පත්, සංවර්ධනය හෝ ප්‍රතිසංස්කරණය කිරීමේදී

පාර්ලිමේන්තු යෝජනා සම්මුතියද ජාතික උපදේශණ කොමිසමෙහි (NAC) පූර්ණ අනුමැතියද ලබාගතයුතු වන්නේ හුදෙක් දැයෙහි අභිවෘධිය පිණිස දේශමාමක දූපුතුන් බිහිකරලීමද, බහුවාර්ගික සමාජ සංකළණය තුලින් සංහිඳියාව ඇතිකිරීමද නව අධ්‍යාපණ ප්‍රතිසංස්කරණය තුලින් ඉලක්කගත ප්‍රධාන අපේක්ෂාවන් වන බැවින්ය.

## **06-කණිෂ්ඨ අධ්‍යාපනය** (Grades 6,7,8)

අරමුණුඃ

1- දරුවාතුල සමාජ සංස්කෘතික ශික්ෂණය ස්ථාපණය කිරීම

2- දරුවාතුල විෂයානුබද්ධ මූලික සිද්ධාන්ත දැණුම වර්ධනය

3- දරුවාතුල නවනිර්මාණ චරිතාපධානය බිහිකිරීම

මාධ්‍යය:

1. සිංහළ + ඉංග්‍රීසි
2. දෙමළ + ඉංග්‍රීසි

විෂයන්:

1. රූපන කලාව, ගීතකාව්‍ය රසාස්වාදය හා නිර්මාණකරණය, සංගීතය, නර්ථනය (කැමැත්ත අනුව ශේත්‍ර ප්‍රයෝගික පුහුණුව)
2. ආගම
3. මව්බස
4. මානව සම්භවය හා දේශයේ ඉතිහාසය
5. දෙවනබස (ඉංග්‍රීසි)
6. සෞඛ්‍යය
7. සමාජ හා පාරිසරික ආරක්ෂණය
8. ගණිතය-1(සංඛ්‍යාණය හා වාණිජ අංකගණිතය)
9. ගණිතය-2 (ප්‍රස්තාර හා ඉංජිනේරුවිද්‍යා ගණිතය)
10. සාමාන්‍ය විද්‍යාව (භෞතික, ජීව හා රසායණ)
11. කෘෂිකර්මය
12. ක්‍රීඩා (විෂයානුබද්ධ දැණුම හා ප්‍රායෝගික පුහුණුව)

## **07-ප්‍රාථමික අධ්‍යාපනය (Grades 2,3,4,5)**

1. මව්බස -වරණය

2. ආගමික ශික්ෂණය (බුදුදහම හින්දුආගම කිතුණුආගම ඉස්ලාම්ආගම) –වරණය
3. ඉංග්‍රීසි
4. රූපණ කලාව, සංගීත කලාව, සංස්කෘතික නර්තනය
5. ක්‍රීඩා කෞශල්‍යය
6. ගණිතය
7. සෞඛ්‍යය
8. නිර්මාණ කෞශල්‍යය

## 08- ළදරු අධ්‍යාපනය (Grades M+1)

**අරමුණු:**

1. මව්බස හැසිරවීමෙහි සුහුරුබව ළදරුවාතුල වර්ධනය කිරීමෙන් භාෂාවතුල නිදන්ගත සම්භවයේ ආවේණීය කුසළතාවයන් නිරායාසයෙන් දරුවාතුල ස්ථාපණය කිරීම
2. දරුවාතුල නවනිර්මාණය හා සහජකුසළතාවයන් වර්ධණය
3. සමූහ ක්‍රියාකාරකම් තුලින් වගකීම් බෙදාහදාගැනීම පිළිබඳ පුහුණුව

**රෙගුලාසි හා අධීක්ෂණය** :

1. අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ආයතන ලියාපදිංචිය හා විෂයකරුණු සංවර්ධනය හා අධීක්ෂණය
2. පුහුණුව ලබාදීම හා පුහුණු ගුරුවරුනට මාසිකදීමනාවක් ලබාදීම

## 09- ආගමික අධ්‍යාපනය:

ප්‍රඥප්තියඃ

බහුවාර්ගික සංකලණයක් සහිත සිංහළ බෞද්ධ රටක්වන ශ්‍රී ලංකා ජනරජයෙහි සංස්කෘතීන් අතර අන්නෝන්‍ය සමාදානය හා සංහිඳියාව පලුදුකරවනසුලු කිසිදු ආගමික අන්ත මතවාදයක් ඉගැන්වීම හෝ ශික්ෂණය සපුරාතහනම්වෙයි

ප්‍රස්ථාවෙහි දිශානතිය:

1. අධ්‍යාත්මික ශික්ෂණය තුලින් පුද්ගල අභිවෘධිය හා සාමාජීය සංහිඳියාව ඉලක්කගතවන ධර්මකොටස් පමණක් විෂයමාලාවට ඇතුලත්විය යුතුය
2. විෂය නිර්දේශයන් අධ්‍යාපණ අමාත්‍යාශයේ වගකීමට යටත්වෙයි

ප්‍රස්ථාවෙහි ක්‍රියාන්විතයඃ

1. ධර්මාචාර්ය සුදුසුකම් සපුරාඇති ආචාර්යවරුන් (ගිහි හෝ පැවිදි) තෝරාපත්‍රගතු ලබයි
2. ධර්මාචාර්ය වරුන්ගේ හැකියාවර්ධණය පුහුණුව හා වෘතීය නියාමණය අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පැවරෙයි

<u>දහම් පාසල් අධ්‍යාපනය</u>:

ප්‍රාදේශීය දම්සහා මණ්ඩල විසින් ලියාපදින්චි කරනුලබන ආචාර්යවරුනට මාසික දීමණාවක් ලබාදීම හා විෂයමාලා අධික්ෂණයද වෙනම අමාත්‍යාංශයකට පැවරෙන අතර එය '**බහුසංස්කෘතික හා ආගමික සංහිඳියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය**' ලෙස නම්කෙරෙයි

සියලු ආගම්වලට අයත් දම්සහාපීඨ (හෙවත් පිරිවෙන් හෝ මිශණාරි ) අධ්‍යාපන ධාරාවද යතෝක්ථ අමාත්‍යාංශය යටතට පත්තෙරෙයි

**සිරිල් තල්පෙ ගමගේ**

05-12- 2021